# රජගල ආරණ්‍ය සේනාසනය ආරක්ෂා කිරීම හා සංචාරකයාට පිළිගැන්වීම පිළිබඳ අධ්‍යයනයක්

ජී. එම්. සුමේධ විරාජ් අපොන්සු

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
sumedaviraj1@gmail.com

රජගල ආරණ්‍ය සේනාසනය වුකලී ලක්දිව ඓතිහාසිකවත්, පුරාවිද්‍යාත්මකවත් වටිනාකමක් උසුලන ස්ථානයකි. ශ්‍රී ලංකාවේ බෞද්ධ ඉතිහාසය පිළිබඳව වැදගත් සාධක සහිත මෙම ක්ෂේත්‍රය තුළ විසිර තිබේ. නිරන්තරයෙන් නව අත්දැකීම් ලබාගැනීමට අපේක්ෂා කරන දේශීය හා විදේශීය සංචාරකයා වෙත පිළිගැන්වීමට සැලැස්මක් සකස්කිරීම සහ මෙම ස්ථානය ආරක්ෂා කරගැනීමට ක්‍රමවේද සකස් කිරීම මූලික අරමුණු වේ. ලිඛිත මූලාශ්‍රය පරිශීලනය කිරීම, ක්ෂේත්‍ර ගවේෂණ සහ සම්මුඛ සාකච්ඡා මගින් ද දත්ත රැස් කරගනු ලැබිණි.

රජගල භූමිය පුරා විසිර පවතින නටඹුන් වැනි පුරාවිද්‍යාත්මක සාක්ෂිවලට අනුව අතීතයේ ආරණ්‍යගතව වැඩ සිටි භික්ෂූන්වහන්සේලාගේ ආගමික ජීවිතයට අවශ්‍ය සියලු පහසුකම්වලින් සපිරි විශාල තපෝවනයක් ලෙස පැවති බවට තහවුරු කරගෙන ඇත. ඉතිහාසය ගොඩනැඟීමෙහි ලා ඉතා වැදගත් වන ශිලා ලිපි 80කට නොඅඩු ප්‍රමාණයක් රජගල විහාර සංකීර්ණයෙන් හමු වී ඇත. ඒවා අතර ටැම් ලිපි, පුවරු ලිපි, ගිරි ලිපි, ලෙන් ලිපි ආදිය වේ. මින් ඉතාමත් ම වැදගත් ගිරි ලිපිය සේ පෙන්වාදිය හැක්කේ ඉට්ඨිය තෙරුන්ගේ හා මිහිඳු තෙරුන්ගේ ධාතු නිදන්කර ඉදිකළ දාගැබක් පිළිබඳව විස්තර සපයන ගිරි ලිපිය ය.

එහෙයින් සංචාරකයන් රැසක් මෙම ස්ථානය සියැසින් දැකබලාගැනීමේ අටියෙන් සංචාරයේ නිරතවනු දැකිය හැකිය. දෙස් විදෙස් සංචාරකයන්ගේ සංචරයන් නිසා වසර 2000 කට වඩා පැරණිඉතිහාසයකට උරුමකම් කියන රජගල ආරණ්‍ය සේනාසනයට එල්ලවන බලපෑම ද සුළුකොට තැකිය නොහැකි ය. එහෙයින් ස්වභාව ධර්මයාගේ ත්‍යාගයක් වූ රජගල ආරණ්‍ය සේනාසනයට සිදුවන හානි අවම කරගනිමින් ආරක්ෂිතව සංචාරකයාට පිළිගැන්වීමේ ක්‍රමවේදයන් ඉදිරිපත් කෙරේ.

ප්‍රමුඛ පද : රජගල ආරණ්‍ය සේනාසනය, සංචාරකයාට පිළිගැන්වීම